# BreastScreen WA

Sinhalese සිංහල

## පියයුරු පරීක්ෂා තොරතුරු - වෙනත් භාෂාවලින්ද ලබාගත හැකිය



### පියයුරු පිළිකා - දත්ත

ඕස්ට්‍රේලියාවේ සිටින කාන්තාවන් හට ජීවිතයට වඩාත්ම තර්ජනයක් ඇතිකරන බහුලම පිළිකාව පියයුරු පිළිකාව වන අතර මෙය වැළැක්විය නොහැක.

**පියයුරු පිළිකා වර්ධනයවීම සම්බන්ධයෙන් ඇති වඩාත්ම අවදානම් සාධකය වන්නේ වියපත්වීමයි.**

පියයුරු පිළිකා යනු අසාමාන්‍ය සෛල කාණ්ඩයක් වර්ධනයවී ගුණනය වීමයි. අවසාන වශයෙන් මෙම සෛල පියයුරුවල ගැටිත්තක් ඇති කරයි. මෙම පිළිකාව ඉවත් කලේ හෝ පාලනය කලේ නැතිනම්, පිළිකා සෛල සිරුරේ අනෙක් කොටස්වලට පැතිරී මරණය සිදුවිය හැකිය. මුල් අවධියේද පියයුරු පිළිකාව සොයා ගැනීම මගින් සාර්ථක ලෙස ප්‍රතිකාර කිරීමේ අවස්ථාව වැඩිදියුණු කරයි.

### මැමොග්‍රෑම් පරීක්ෂාවක් කරගත හැක්කේ කා හටද?

BreastScreen WA මගින් පියයුරුවල රෝගලක්ෂණ නැති වයස අවුරුදු 40ට වඩා වැඩි කාන්තාවන් හට **නොමිළේ** මැමොග්‍රෑම් පරීක්ෂා ලබාදේ. BreastScreen WA මගින් වයස අවුරුදු **50 සිට 74** අතර කාන්තාවන් හට සෑම වසර දෙකකටම වරක් **නොමිළේ** මැමොග්‍රෑම් පරීක්ෂාවක් කර ගැනීමට උනන්දු කරවයි.

**75%කට වඩා පියයුරු පිළිකා සොයා ගන්නේ වයස අවුරුදු 50 හෝ ඊට වැඩි කාන්තාවන් අතරේය.**

BreastScreen WA සෑම කාන්තාවකගේම පුද්ගලිකත්වය සහ ගරුත්වයට ගරුකරයි. මැමොග්‍රෑම් පරීක්ෂාවක් කර ගැනීම ඔබගේ තේරීමයි. අදාල තීරණය ගැනීමේදී, ඔබගේ අවස්ථානුගත කරුණු ඔබගේ වෛද්‍යවරයා සමග සාකච්ඡා කිරීමට ඔබට තීරණය කල හැකිය.

### මැමොග්‍රෑම් පරීක්ෂාවක් යනු කුමක්ද?

මැමොග්‍රෑම් පරීක්ෂාවක් යනු කාන්තාවකගේ පියයුරු ඇතුලත ලබා ගන්නා එක්ස් රේ ඡායාරූපයක් හෝ පිංතූරයකි. පියයුරු පිළිකා කල් ඇතිව හඳුනා ගැනීමට ඇති හොඳම ක්‍රමය වන්නේ මැමොග්‍රෑම් පරීක්ෂාවයි. ඔබ හෝ ඔබගේ වෛද්‍යවරයා හට පියයුරු පිළිකාව ඇති බවට අතට දැනීමට පෙර මැමොග්‍රෑම් පරීක්ෂාවක් මගින් පියයුරු පිළිකාව හඳුනා ගත හැකිය.



### මැමොග්‍රෑම් පරීක්ෂාවක් සිදුකරන්නේ කෙසේද?

ඔබගේ පියයුරු එක්ස් රේ යන්ත්‍රය මත ප්‍රවේසමින් තබා එක්ස් රේ ඡායාරූපය ගන්නා අතර තත්පර කිහිපයක් තෙරපනු ඇත. එක් එක් පියයුර සඳහා එක්ස් රේ ඡායාරූප දෙකක් ගනු ඇත, එකක් ඉහල සිට සහ අනෙක පැත්තක සිට වන ආකාරයට ගනු ඇත.

පියයුරු තෙරපීම වැදගත් වන්නේ ඒ මගින් වඩාත්ම පැහැදිලි ඡායාරූපය ගත හැකි අතර අඩුම ප්‍රමාණයක විකිරණ ප්‍රමාණයක් භාවිතා කිරීමයි (පහත පිංතූරය බලන්න).

තෙරපීම හේතුවෙන් තද හෝ අපහසු බවක් දැනුනද මෙය තත්පර කිහිපයකට පමණි. ඕනෑම අවස්ථාවක විකිරණ ශිල්පියාගෙන නවත්වන ලෙස ඉල්ලා සිටිය හැකිය.




### නොමිළේ සිදු කරන මැමොග්‍රෑම් පරීක්ෂාවක් සඳහා BreastScreen WA වෙත ගියවිට කුමක් සිදුවේද?

BreastScreen WA සායනවල සිටින සියළු කාර්ය මණ්ඩල කාන්තාවන්වේ.

ඔබට මැමොග්‍රෑම් පරීක්ෂාවක් ඇතිවිට, කෑබලි දෙකක ඇඳුමක්, සායක් හෝ කලිසමක් සහ කමිසයක් වැනි ඇඳුමක් අඳින්න.

ඔබගේ හමුව ඇති දිනයේ ටැල්කම් පවුඩර් හෝ සුවඳ විලවුන් භාවිතා නොකරන්න.

ඔබ BreastScreen WA වෙත පැමිණි විට:

- ඔබව පිළිගෙන පෝරම කිහිපයක් සම්පූර්ණ කිරීමට ඔබගෙන් ඉල්ලා සිටිනු ඇත.
- ඔබට ඇඳුම් මාරු කරන කාමරයක් පෙන්වා ඔබගේ උඩුකය යට ඇඳුම (bra) ගලවා පිටතින් ඇති ඇඳුම නැවත ඇඳ ගැනීමට උපදෙස් දෙනු ඇත. ඔබට අවශ්‍ය නම් ඇඳීමෙන් පසු ඉවත දැමිය හැකි ගවුමක් ලබාදෙනු ඇත.
- කාන්තා විකිරණ ශිල්පිනියක ඔබව එක්ස් රේ කාමරය වෙත රැගෙන ගොස් ප්‍රශ්න කිහිපයක් අසනු ඇත. ඉන්පසුව එක් එක් පියයුරක එක්ස් රේ ඡායාරූප දෙක බැගින් ලබා ගනු ඇත.
- ඔබ පිටත්ව යා යුතු වේලාව විකිරණ ශිල්පිනිය විසින් ඔබට කියනු ඇත.
- විශේෂයෙන් පුහුණුකල වෛද්‍යවරුන් අවම වශයෙන් දෙදෙනෙකුවත් ඔබගේ එක්ස් රේ ඡායාරූප සමාලෝචනය කරනු ඇති අතර ඔබගේ ප්‍රතිඵල සති දෙකක සිට සති තුනක කාලයක් ඇතුලත ඔබට ලැබීමට සැලැස්වීමට සියළු උත්සාහයන් දරණු ඇත.
- සමහර අවස්ථාවල තවදුර එක්ස් රේ ඡායාරූප ලබා ගැනීම සඳහා කාන්තාවන් කැඳවනු ඇත. මෙසේ කිරීම අවශ්‍යනම්, මේ සම්බන්ධයෙන් ඔබ සමග සාකච්ඡා කිරීම සඳහා BreastScreen WA කාර්යමණ්ඩල සාමාජිකයෙකු ඔබව අමතනු ඇත.

**හමුවීමක් සඳහා දුරකථන අංක 13 20 50 අමතන්න**

## මා හට මැමොග්‍රෑම් පරීක්ෂාවක් කරගත හැක්කේ කොහේදීද?

BreastScreen WA සතුව මෙට්‍රොපොලිටන්, ප්‍රාදේශීය සහ ජංගම පරීක්ෂණ සේවා ඇත.

ඔබට ආසන්න ස්ථානයක් සොයාගැනීම සඳහා:
www.breastscreen.health.wa.gov.au/Breast-screening/Breast-screening-locations

- සෑම වසර 4කට වරක්ම ජංගම සේවා හතරක් ගම් වෙත පැමිණේ. පැමිණෙන දින සම්බන්ධ දළ අදහසක් ලබා ගැනීම සඳහා පහත වෙබ්අඩවිය වෙත පිවිසෙන්න:
  www.breastscreen.health.wa.gov.au/Breast-screening/Rural-and-remote-women
- බොහෝ සායනවල සවස් සහ සෙනසුරාදා හමුවීම් ඇත.
- සියළු BreastScreen WA සේවාවල රෝදපුටු ප්‍රවේශය ඇත.
- භාෂණ පරිවර්තකයන් නොමිළේ ලබාගත හැක.

## මා හට හමුවීමක් යොදාගත හැක්කේ කෙසේ?

ඔබට භාෂණ පරිවර්තන සහාය අවශ්‍යනම්, කරුණාකර දුරකථන අංක **13 14 50** ඔස්සේ භාෂා සහ භාෂණ පරිවර්තන සේවාව (TIS) අමතා දුරකථන අංක **13 20 50** ඔස්සේ BreastScreen WA මධ්‍යම වෙන්කරවා ගැනීමේ සේවාව (central booking service) හා සම්බන්ධ කරදෙන ලෙස ඉල්ලා සිටින්න.

එසේ නැතිනම්, නොමිළේ සිදුකරන මැමොග්‍රෑම් පරීක්ෂාවකට හමුවීමක් සඳහා දුරකථන අංක **13 20 50** අමතන්න (දේශීය ඇමතුම් ගාස්තුවට).

සියළු BreastScreen WA සායනවල සම්මත හමුවීම් සඳහා **මාර්ගගත වෙන්කිරීම් ඇත**

**www.breastscreen.health.wa.gov.au**

## සමූහ වෙන්කිරීම්

කණ්ඩායමක් වශයෙන් පැමිණීමට මනාප කාන්තාවන් සඳහා කණ්ඩායම් වෙන්කිරීම් ඇත. කණ්ඩායම් වෙන්කිරීම් සම්බන්ධ වැඩිදුර විස්තර සඳහා කරුණාකර දුරකථන අංක **13 20 50** අමතන්න.

## වෙනත් භාෂාවලින් ඇති තොරතුරු

BreastScreen WA සතුව වෙනත් භාෂාවලින්ද තොරතුරු ඇත. එම තොරතුරු සඳහා පහත වෙබ්අඩවිය වෙත පිවිසෙන්න:
www.breastscreen.health.wa.gov.au/Breast-screening/Multicultural-women

## වෙන කුමක් මා විසින් කල හැකිද?

ඔබ නිතිපතා මැමොග්‍රෑම් පරීක්ෂාව සිදුකර ගත්තද, සියළු කාන්තාවන් හට පියයුරු සම්බන්ධයෙන් අවධානයෙන් සිටින ලෙස BreastScreen WA උනන්දු කරයි.
පියයුරු සම්බන්ධයෙන් අවධානයෙන් සිටීම යනු විවිධ අවස්ථාවල ඔබගේ පියයුරු පෙනෙන ආකාරය සහ එයට දැනෙන ආකාරය ගැන අවබෝධයෙන් සිටීමවේ. පියයුරුවල සිදුවන බොහෝ වෙනස්කම් සාමාන්‍ය වන අතර හේතුව හෝර්මෝන වෙනස්කම් සහ වියපත්වීමවේ. ඔබගේ පියයුරුවල සාමාන්‍ය පෙනීම සහ ඔබගේ පියයුරු අතට දැනෙන ආකාරය දැනගෙන සිටීම වැදගත්වේ. හේතුව ඒ මගින් ඔබට නව හෝ අසාමාන්‍ය වෙනස්කම් හඳුනා ගැනීමට හැකිවීමයි. කාලයෙන් කාලයට කන්නාඩියකින් ඔබගේ පියයුරු බලා ඒවා අතට දැනෙන ආකාරය බලන්න.

බැලිය යුතු වෙනස්කම් අතර පහත දේ ඇත:

- නව ගැටයක්, හෝ පියයුරු හෝ කිහිල්ල ප්‍රදේශයේ ගැට සහිත හෝ ඝණවීමක්;
- යම් දෙයක් පිටවීමක්, දිශාවේ වෙනසක්, වණයක් හෝ කැසීමක් ඇතුළුව තණපුඩුවල වෙනස්කම්;
- තණපුඩුවේ හෝ පියයුරුවල ප්‍රමාණයේ හැඩයේ හෝ වර්ණයේ ඕනෑම වෙනසක්;
- සමේ සිදුවන වල ගැසීමක්, රත්පැහැ ගැනීමක් හෝ දද වැනි ඕනෑම වෙනසක්; හෝ
- ඕනෑම අසාමාන්‍ය හෝ දිගටම පවතින වේදනාවක්.

**ඔබගේ පියයුරුවලට මේ ආකාරයේ කිසියම් වෙනසක් සිදුවී ඇතිනම්, ඔබගේ වෛද්‍යවරයා හමුවන්න.**



උරපතු ඇටයේ සිට උඩුකය යටි ඇඳුමේ පහත මායිම (bra line) දක්වා සහ අතට යටි ප්‍රදේශයේ ඇති සියළුම පියයුරු පේශී පරීක්ෂාකර බැලීම ඉතා වැදගත්වේ.

Government of Western Australia
North Metropolitan Health Service

BreastScreen WA
WA's only accredited screening service

BreastScreen AUSTRALIA
A joint Australian, State and Territory Government Program

**BreastScreen WA**
දුරකථන (08) 9323 6700 ෆැක්ස (08) 9323 6799 ඊමේල් breastscreenwa@health.wa.gov.au
**වෙන්කර ගැනීම් 13 20 50**
ජාතික රිලේ සේවාව www.relayservice.gov.au පරිවර්තන සහ තෝල්ක සේවාව (TIS) 13 14 50

HP000373 OCTOBER 2019